**Prepared by –** L.සාගරිකා නිශාන්ති කුමාරි
කෑ/දෙහි/රුවන්වැල්ල රාජකීය විද්‍යාලය
රුවන්වැල්ල කොට්ඨාශය

නිපුණතාව 5.0 - ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදායන් හා සබැදි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතාව 5.1 - නර්තන කලාව හා සබැදි ඓතිහාසික පසුබිම විස්තර කරයි.

## විදේශිකයින්ගේ ඓතිහාසික වාර්තා

14 වන සියවසේ දී එනම් ගම්පොළ යුගයේදී ශ්‍රී ලංකාවට පැමිණි ඉබන් බතුතා නැමැති සංචාරකයාගේ වාර්තාවේ,

"දෙවුන්දර උපුල්වන් දේවාලයේ මිනිස් ප්‍රමාණ උස දෙව්රුවක් අබියස පන්සියක් පමණ හින්දු බාලිකාවන් ගී ගයා නැටූ බව" සඳහන් වේ.

මහනුවර යුගයේ (ක්‍රි.ව. 1592 -1604 ) විමලධර්මසූරිය රජ සමයේ ලංකාවට පැමිණි ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් මහනුවර පෙරහැරේ නැටුම් පිළිබඳ "විදේශීන් දුටු පුරාණ ලංකාව" කෘතියේ සඳහන් කර ඇත.

"මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත් ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකයේ වැඩදැමූ වස්ත්‍ර ඇත්තෙ ය.

මහනුවර යුගයේ දෙවන රාජසිංහ රජ සමයේ (ක්‍රි.ව. 1636 -1686 )ලංකාවට පැමිණි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් "සදා හෙළදිව" නම් ග්‍රන්ථයේ ඇසළ පෙරහැර පිළිබඳවත්, එහි තේවාව පිළිබඳවත් සඳහන් කර ඇත.

"එහි දේවාල විහාරවල තේවාව සඳහා නියම වූ කුල වලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙත්. ඔවුන් හට නියම වූ විවිධ ක්‍රීඩා කරමින් තුන් දෙනා බැගින් අතිනත ගෙන රඟන ස්ත්‍රීහු වෙති."

1) පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

1. කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනන් පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ .................................................. ග්‍රන්ථයේ ය.

2. ස්පිල් බර්ජන් නම් දේශාටන වාර්තාකරුවා.................................................... යුගයේ පැවති නර්තනය පිළිබඳ තොරතුරු අක්වා ඇත.

3. හින්දු බාලිකාවන් පන්සීයක් මිනිස් උස ප්‍රමාණයේ දෙවි රුවක් අබියස ගී ගයා නැටූ බව ........................ ............ ගේ වාර්තාවේ සඳහන් වේ.

4. දේශීය නර්තන කලාවට භාරතීය ආභාෂය ලැබී ඇති බවට පැහැදිලි සාධකයක් දැකිය හැක්කේ ............. ............................................ යුගයේ ය.

5. .........................................................................නැමැති කෘතියේ ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් පෙරහැර නැටුම් පිළිබඳ විස්තර කර ඇත.

6. දේවාල විහාරවල තේවාව පිළිබඳ තොරතුරු සඳහන් කල දේශාටන වාර්තාකරුවා .................................. ............................ය.

2) එක් දේශාටන වාර්තාවක් ඇසුරින් නැටුම් කලාව පැවති තත්වය පිළිබඳ අදහස් දක්වන්න.

3) මහනුවර යුගයේ දී ආගමික අවශ්‍යතා සඳහා නර්තන යොදා ගැනීම පිළිබඳ විමසීමක් කරන්න.